# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරනලදී.

නො. 9,718—1947ක්වූ ජුනි මස 13 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

මම 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3කේ ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:— Kg/කහම්බිලියාවල පාඨශාලාවට ඉඩමක් උවමනා නිසා මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 203 පරිච්ඡේදයේ" 5වෙනි කාණ්ඩයේ සාරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවෙන් නියමකාර මට අණ ලැබී තිබේ; ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 468. ගම—කහම්බිලියාවල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහස, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | එබාඑළුවේගේවත්ත නොහොත් කොහෝලේවත්ත | පොල්ගස් 35යි, පොල්පැල 12යි, කොස්ගස් 13යි, පුවක්ගස් 9යි, පුවක්පැල 9යි, මුරුන්ගාගස් 4යි, ලොළුගස් 3යි, ජම්බුගස් 3යි, දෙළුම්ගස් 1යි, දෙහිගස් 1යි, දෙමටගස් 10යි, අශෝකගස් 1යි, මීගස් 1යි, සියඹලාගස් 2යි, බම්බු පඳුරු 1යි, හැඳෝල්ගස් 1යි, කෙසෙල්පඳුරු 24යි, පාඨශාලා ගොඩනැගිලි 1යි, මැසිකිලි 2යි, සිමෙන්තියෙන් බදිනලද ළිඳක් සහ තාවකාලික ගාලයක් | කහම්බිලියාවල පදිංචි කාපුරමුදියන්සේලාගේ පුංචිබණ්ඩා, එම කිරිමුදියන්සේ, සේනකරලලාගේ පුංචිමෙනිකා සහ බමුණෝගේවිටාරගේ ගුණතිලක | 1 0 10 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකරන තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම හඳුන්වා තොරතුරු තමුන් වෙනුවට ක්‍රියාකරණ ලෙස මම 1947ක්වූ ජුලි මස 18වෙනි දින පෙව 3ට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකමද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතියේ තොරතුරු කියාසිටින් ඕනෑබව මෙසින් දැනගත යුතුයි.

මම 1947ක්වූ ජුනි මස 4වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

සේ. කනගසුන්දරම්,
ආණ්ඩුවේ උප ඒජන්ත මහතා.

## 1946යේ අංක 53 දරණ නගර සභා ආඥාපණත යටතේ සාමාජිකයින් තේරීමේ දැන්වීම.

### අතුරු උපදේශකයකු තේරීම.

1. මිනුවන්ගොඩ නගර (ටවුන්) සභාවේ කො. 5 දරණ කොට්ඨාශයට උපදේශකයකු තේරීම සඳහා අතුරු මන්ත්‍රීන් තේරීමක් පැවැත්වීමට 1946 නො. 53 දරණ ව්‍යවස්ථාවේ 27, 2 (a) දරණ වගන්තියේ ප්‍රාදේශික අධිකාරී සභාවලට මන්ත්‍රීන් තේරීම පිළිබඳ ව්‍යවස්ථාවේ උපදේශකයකු වීමට තෝරාගනු ලැබීම සඳහා ඉදිරිපත්කරන ඉල්ලුම්පත්‍ර 1947 ජූනි මස 30වෙනි දින දවල් 12ටත් 1ටත් අතරතුර මිනුවන්ගොඩ නගර සභා කන්තෝරුවේදී භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් කොට්ඨාශයේ තේරීමේ නිලධාරිතැන වශයෙන් අතිරේක උප දිසාපති හැන්පත් ඒ. අරුල්ප්‍රගාසම් මහත්මයා මා විසින් තෝරා පත්කරනලදී.

3. ප්‍රාදේශික අධිකාරී සභාවලට මන්ත්‍රීන් තේරීම් පිළිබඳ ව්‍යවස්ථාවේ 30වෙනි වගන්තිය යටතේ රුපියල් 100ක ඇප මුදලක් 1947 ජූනි මස 30වෙනි දින දවල් 1ට ප්‍රථම තේරීමේ නිලධාරිතැන වෙත තැන්පත්කළ යුතු බව ඉල්ලුම්කරුවන්හට සිහිපත් කරවමි.

4. නියමිත ඉල්ලුම්පත්‍රයේ පිටපත 1947 ජූනි මස 30වෙනි දින දවල් 1ට ප්‍රථම තේරීමේ නිලධාරිතැනගෙන් ලබාගත හැක.

වී. කුමාරස්වාමි,
කොළඹ දිස්ත්‍රික්කයේ ජන්ද විමසීම පිළිබඳ අධිකාරී.

මම 1947ක්වූ ජූනි මස 9 වැනි දින
කොළඹ කච්චේරියේදීය.

---

### අතුරු උපදේශකයකු තේරීම.

1. මිනුවන්ගොඩ නගර (ටවුන්) සභාවේ කො. 6 දරණ කොට්ඨාශයට උපදේශකයකු තේරීම සඳහා අතුරු මන්ත්‍රීන් තේරීමක් පැවැත්වීමට 1946 නො. 53 දරණ ව්‍යවස්ථාවේ 27, 2 (a) දරණ වගන්තියේ ප්‍රාදේශික අධිකාරී සභාවලට මන්ත්‍රීන් තේරීම පිළිබඳ ව්‍යවස්ථාවේ උපදේශකයකු වීමට තෝරාගනු ලැබීම සඳහා ඉදිරිපත්කරණ ඉල්ලුම්පත්‍ර 1947 ජූනි මස 30වෙනි දින දවල් 12ටත් 1ටත් අතරතුර මිනුවන්ගොඩ නගර සභා කන්තෝරුවේදී භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් කොට්ඨාශයේ තේරීමේ නිලධාරිතැන වශයෙන් අතිරේක උප දිසාපති හැන්පත් ඒ. අරුල්ප්‍රගාසම් මහත්මයා මා විසින් තෝරා පත්කරනලදී.

3. ප්‍රාදේශික අධිකාරී සභාවලට මන්ත්‍රීන් තේරීම් පිළිබඳ ව්‍යවස්ථාවේ 30වෙනි වගන්තිය යටතේ රුපියල් 100ක ඇප මුදලක් 1947 ජූනි මස 30වෙනි දින දවල් 1ට ප්‍රථම තේරීමේ නිලධාරිතැන වෙත තැන්පත්කළයුතු බව ඉල්ලුම්කරුවන්හට සිහිපත්කරවමි.

4. නියමිත ඉල්ලුම්පත්‍රයේ පිටපත 1947 ජූනි මස 30වෙනි දින දවල් 1ට ප්‍රථම තේරීමේ නිලධාරිතැනගෙන් ලබාගත හැක.

වී. කුමාරස්වාමි,
කොළඹ දිස්ත්‍රික්කයේ ජන්ද විමසීම පිළිබඳ අධිකාරී.

මම 1947ක්වූ ජූනි මස 9වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

---

## සුප්‍රිම් උසාවියේ දැන්වීමයි.

ශ්‍රී ලංකාද්වීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙසින් ප්‍රකාශ කරන්නේනම් මාතර දිසාවේ ක්‍රිමිනෙල් නඩු විභාගය මේ 1947ක්වූ ජූනි මස 16වෙනි දින පෙරවරු 11 පැය පටන් මාතර තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදුනාවූ ඇත.—එහි යම් කාරණා ඇතුව සිටින සැමදෙනාම යම්කිසි ස්ථානයට යම්කිසි වේලාවට ඇවිත් පෙනීසිටින්ට ඕනෑමත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙසින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඇම්. රණසිංහ,
මාතර ඩැපියුටි ෆිස්කල් වරයා.

මම 1947ක්වූ ජූනි මස 5වෙනි දින මාතර
ඩැපියුටි ෆිස්කල් කන්තෝරුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.